Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

මාතර මහා නගර සභාව

මාතර මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරු නාමය	*තනතුරු සංඛ්‍යාව*	*මාසික වැටුප් පරිමාණය*	*අවම අධ්‍යාපන සුදුසුකම්*
මෝටර් කාර්මික III ශ්‍රේණිය	1	රා.ප.ච.3/2016 අනුව PL2-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. අදාල තනතුරට නියමිත පරිදි තෘතියක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතුය. අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
පින්තාරුකරු (වාහන) III ශ්‍රේණිය	1	රා.ප.ච.3/2016 අනුව PL 2-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. අදාල තනතුරට නියමිත පරිදි තෘතියක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතුය. අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
ආදහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය	1	රා.ප.ච.3/2016 අනුව PL 2-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. අදාල තනතුරට නියමිත පරිදි තෘතියක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබිය යුතුය. අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.
කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණිය	2	රා.ප.ච.3/2016 අනුව PL 1-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හය (06)ක් සමත්වී තිබිය යුතුය.
ගස් කැපුම්කරු III ශ්‍රේණිය	1	රා.ප.ච.3/2016 අනුව PL 1-2016 වැටුප් කාණ්ඩයෙහි ආරම්භක පියවර	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02)ක් සහිතව විෂයන් හය (06)ක් සමත්වී තිබිය යුතුය.

පොදු සුදුසුකම් :

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

IV. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය.

V. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමය :

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

II. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II. වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමි වේ.

III. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයක සිටින සේවකයන් ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. එමෙන්ම වසර තුනක සේවා කාලය අවසන් වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

IV. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජයේ හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයන් බැඳී සිටියි.

ඉල්ලුම් කළ යුතු ආකාරය :

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2017.09.29 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මාතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපතක් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

I. උප්පැන්න සහතිකය;
II. අධ්‍යාපන සහතික;
III. පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය. (ප්‍රදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.);
IV. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්;
V. පළපුරුද්ද පිළිබඳ සහතිකය;
VI. මාතර මහා නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්.

සේනක පල්ලියගුරුගේ,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව-මාතර.

2017 අගෝස්තු මස 11 වැනි දින,
මහා නගර සභාව-මාතර.

..... **තනතුර සඳහා අයදුම්පත**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :————————————————. :
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————————.
3. තැපැල් ලිපිනය :————————————————.
4. දුරකථන අංකය :————————————————.
5. උපන් දිනය : වර්ෂය :————————. මාසය:————————. දිනය :————————
6. ජාතික හැඳුනුම්පත් අංකය :————————————————.
7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————————. මාස .:———————— දින :————————
8. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————————.
9. විවාහක/ අවිවාහක බව :————————————————.
10. ජාතිය :————————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :
12. අධ්‍යාපන සුදුසුකම් :————————————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————————————.
14. ඔබ දැනටමත් මාතර මහා නගර සභාවේ සේවය කරන්නේ නම් :————————————————.
    I. දැනට දරන තනතුර :————————
    II. එම තනතුරට පත් වූ දිනය :————————
    III. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද):————————

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙමගින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

දිනය :————————.

————————————————.

අයදුම්කරුගේ අත්සන.